**සීමාසහිත ලංකා සළුසල සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂ 13 ක කාල පරිච්ඡේදය සඳහා වූ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

සීමාසහිත ලංකා සළුසල සමාගමේ (“සමාගම”) 2009 අප්‍රේල් 01 දින සිට 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ 13 ක කාල පරිච්ඡේදයට අදාළ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2009/2010, 2010/2011, 2011/2012, 2012/2013, 2013/2014, 2014/2015, 2015/2016, 2016/2017, 2017/2018, 2018/2019, 2019/2020, 2020/2021, 2021/2022 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන ඉහත කාල පරිච්ඡේදයන් සඳහා සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු නොකිරීම හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වි දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2009/2010 වර්ෂයේ සිට 2021/2022 වර්ෂය දක්වා අඛණ්ඩව ගිණුම් වර්ෂ 13 ක් සඳහා මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනය වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

# 2 විගණන නිරීක්ෂණ

## 2.1 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් අවසන් වරට විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අලාභය රු.72,829,341 ක් විය. ඊට අනුරූපීව 2008 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ අලාභය රු.17,402,986 ක් විය.<br>2022 වන විට ජාවත්ත හා නුගේගොඩ හැරුණු විට දිවයින පුරා පිහිටි අනෙකුත් සියළුම අලෙවිසැල් හා නිෂ්පාදන කර්මාන්තශාලා වසා තිබූ අතර, යන්ත්‍රසූත්‍ර භාවිත නොවී තිබුණි. අවසන් වරට විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු 2009 | 2021/2022 වර්ෂය වන විට මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන නොමැතිව නිසි කලමනාකරණයකින් යුතුව ලාභ ලබන බවත් එම තත්ත්වය තවදුරටත් වර්ධනය කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | විගණන කටයුතු සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව කාරක ප්‍රාග්ධනය රු.407,682,922 කින් හා ශුද්ධ වත්කම් රු.467,878,681 කින් සෘණ අගයක් ගෙන තිබුණි. තවද, 2016 වර්ෂයේදී ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව සමාගමේ ස්ථිර සේවකයන් සඳහා ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර සේවකයින් 194 දෙනෙක් විශ්‍රාම ගත්වා තිබුණි. විගණිත දිනය වන විට ස්ථිර සේවකයන් 19 දෙනෙකු සහ දෛනික හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් කාර්යය මණ්ඩලය 10 දෙනෙකුද, සේවයේ නිරතවී සිටී.

**2.2** 2008/2009 ගිණුම් වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති වටිනාකම් සම්බන්ධයෙන් 2009/2010 ගිණුම් වර්ෂයේ සිට 2021/2022 ගිණුම් වර්ෂ දක්වා එම ගනුදෙනු හා ශේෂයන්ගේ පැවැත්ම පිළිබඳව ඉදිරිපත් කළ සාක්ෂිවලින් තහවුරුවක් ලබාගත නොහැකි විය.

| | **විගණන නිරීක්ෂණය** | | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **විෂයය** | **වටිනාකම (2008/2009 මූල්‍ය ප්‍රකාශන අනුව) (රු.)** | | |
| (අ) | දේපළ පිරියත හා උපකරණ | 24,594,955 | 2009.03.31 දින තත්ත්වය වන අතර පසු කාලීනව මුදල් ලැබීම් සහ අනෙකුත් අනුශාංගික ලියවිලි මගින් මෙම තත්ත්වය වඩාත් තහවුරු කර ගත හැකි බව. | ගනුදෙනු හා ශේෂයන්ගේ පැවැත්ම තහවුරු වන ලෙස පොත්පත්, වාර්තා හා ලේඛන පවත්වා ගත යුතුය. |
| (ආ) | අවසන් තොගය | 17,892,200 | | |
| (ඇ) | මුදල් හා මුදල් සමාන දෑ | (133,721,396) | | |
| (ඈ) | වෙළඳ හා වෙනත් ණයගැතියන් | 24,966,874 | | |
| (ඉ) | වෙළඳ හා වෙනත් ණය හිමියන් | 391,513,554 | | |
| (ඊ) | බදු කුලී ආදායම් | 19,170,678 | | |
| (උ) | ආයෝජන | 7,000,000 | 1981 අප්‍රේල් මස 14 වන දින ලංකා සළුසල සමාගම විසින් සියයට 100ක හිමි කමක් සහිත ව Lanka Textile and Emporium සමාගම සංස්ථාපනය කර රු. මිලියන 7 ක ආයෝජන කර තිබීමත් එම සමාගමේ කටයුතු පවත්වා ගැනීම සඳහා ප්‍රාග්ධනයට අමතරව ලබා දුන් රු.70,134,234 ක මුදල වේ. දැනට මෙම සමාගම අක්‍රීය තත්ත්වයට පත්ව ඇති බව. | සමාගම් පනතේ 487(3) වගන්තිය අනුව 2010 වර්ෂයේදී නාමය කපා හැර ඇති බැවින් වත්කම් උපලබ්ධි කර ගැනීමේ හැකියාව සලකා බැලිය යුතුය. |
| (ඌ) | සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු | 70,134,234 | | |

## 2.3 වත්කම, වගකීම්, ආදායම් හා වියදම්

2009 මාර්තු 31 දිනෙන් අවසන් 2008/2009 ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | වටිනාකම<br>රු. |
|---|---|
| **<u>වත්කම්</u>** | |
| ජංගම නොවන වත්කම් | 31,594,965 |
| ජංගම වත්කම් | 165,312,909 |
| | -------------- |
| මුළු වත්කම් | 196,907,874 |
| | ========= |
| **<u>බැරකම්</u>** | |
| ජංගම බැරකම් | 572,995,831 |
| ජංගම නොවන බැරකම් | 91,790,725 |
| ප්‍රාග්ධනය හා සංචිත | (467,878,682) |
| | -------------- |
| මුළු බැරකම් | 196,907,874 |
| | ========= |
| දළ ලාභය | 1,228,565 |
| වෙනත් ආදායම් | 21,180,221 |
| අඩුකළා | |
| | (95,238,127) |
| මුළු වියදම | --------------- |
| වර්ෂයේ අලාභය | (72,829,341) |
| | ========= |

2009 මාර්තු 31 දිනට සමාගමේ මුළු වත්කම් මෙන් තුන් ගුණයක් බැරකම් පැවති බව නිරීක්ෂණය විය.

## 2.4 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනත | | | |
| | (i) 131 (1) වගන්තිය | වර්ෂයකට වරක් නියමිත ආකෘතියෙන් වූ වාර්ෂික වාර්තාවක් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදී නොතිබුණි. | මෙහි දක්වා ඇති නිරීක්ෂණ පිළිබඳ අවධානය යොමු කොට ඉදිරියේදි ඊට අනුකූලව කටයුතු කරන බව. | පනතේ දක්වා ඇති විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 170 (1) වගන්තිය | විගණන වාර්තාවද සමගින් වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා භාර දී නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 5.2.4 ඡේදය | වර්ෂ 13 සම්බන්ධයෙන්ම වාර්ෂික අයවැය ලේඛන පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 7.4.5 ඡේදය | සමාගමේ එක් එක් අංශවල ඉන්වෙන්ට්‍රි පොත් නඩත්තු කිරීම හා සමීක්ෂණ මණ්ඩල වාර්ෂිකව පත්කර, තොග හා ස්ථාවර වත්කම් සත්‍යාපන කටයුතු සිදු කර නොතිබුණි. | -එම- | තොග හා ස්ථාවර වත්කම් සමීක්ෂණ කටයුතු වාර්ෂිකව සිදු කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 8 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය | ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අතිරික්ත සේවකයන් විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව කඩිනමින් සංශෝධිත කාර්ය මණ්ඩලයත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගත යුතු වුවත්, එසේ කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලසීමාවන්ට අදාළව පිළියෙල කර නොතිබුණි. | -එම- | සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලසීමාවන්ට අදාළව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය | 2011 ජූනි සිට 2015 නොවැම්බර් දක්වා කාලය වෙනුවෙන් එක් නිලධාරියෙකුට රු.276,865 ක් හා තවත් නිලධාරීන් 8 දෙනෙකුට 2016 අගෝස්තු සිට නොවැම්බර් දක්වා වූ කාලය වෙනුවෙන් | -එම- | සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.277,991 ක් වූ සේවක අර්ථසාධක දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා 2019 වර්ෂයේදී අධිභාර වශයෙන් රු.252,178 ක් ගෙවීමට සිදුවී තිබුණි. එමෙන්ම සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් එළඹෙන මාසයේ අවසන් දිනට පෙර ගෙවිය යුතු වුවත් 2019 අප්‍රේල් 01 සිට 2022 මාර්තු 31 දක්වා කාලය තුළ එසේ ගෙවීම් නොකළ අවස්ථා 15 ක් නිරීක්ෂණය විය. | | |
| (ඊ) | 1982 අංක 04 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 27 වගන්තිය | සේවක භාරකාර අරමුදල සඳහා මාසික සේවා දායකත්වය පසුව එළඹෙන මාසයේ අවසන් දිනට පෙර ගෙවිය යුතු වුවත් , එසේ නොකිරීම නිසා වර්ෂයේදී දඩ මුදල් ලෙස රු.100,589 ක් ගෙවීමට සිදුව තිබුණි. | -එම- | සේවක භාරකාර අරමුදල සඳහා මාසික සේවා දායකත්වය පසුව එළඹෙන මාසයේ අවසන් දිනට පෙර ගෙවිය යුතුය. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2009/2010 සිට 2016/2017 දක්වා ගිණුම් වර්ෂ 13 ක කාල පරිච්ඡේදයට අදාළව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය 2014 වර්ෂයේදී දහම්පාසල් ගුරුවරුන්ට නොමිලේ සාරි ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ඒ අනුව සාරි 40,000 ක් රු.මිලියන 56 කට සැපයීමේ ඇණවුම භාරගෙන තිබුණු අතර එම ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර වාචිකව ලබාගත් මිල ගණන් මත මිලදීගැනීම් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සියලු මිලදී ගැනීම්, ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව කළ යුතුය. |
| (ආ) | සමාගමට අයත් මුල්ලේරියාවේ පිහිටි ඉඩම හා ගොඩනැගිලි සඳහා අදාළ බදු කුලිය මාස දෙකකට නොවැඩි කාලයක් ගෙවීම පැහැර හැරීම සිදුවුවහොත් අදාළ බදු කුලියෙන් සියයට 25 ක් දඩයක් ලෙස අයකළහැකි බව බදු ගිවිසුමේ 5 වගන්තියේ දක්වා තිබුණි. එසේ වුවද 2016/17 ගිණුම් වර්ෂයට අදාළව බදුකුලිය ගෙවීම ප්‍රමාදවීම මත අයකර ගත යුතුව තිබූ රු.266,200 ක දඩ මුදලක් අයකර ගැනීම හා ඉඩම හා ගොඩනැගිලි | අදහස් දක්වා නොතිබුණි. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර රජයේ තක්සේරුවක් මත බදු කුලිය තීරණය කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බද්දට ලබාදීමේදී රජයේ තක්සේරුවක් ලබාගෙන බදුකුලිය තීරණය කිරීම කර නොතිබුණි. | | |
| (ඇ) | 2012 ඔක්තෝබර් 11 දිනැති අංක 12/1523/553/020 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබා දුන් අනුමැතිය පරිදි සමාගමට අයත් උණවටුන පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල ලක්සල ආයතනයට පැවරීමටත් එහි සේවය කරනු ලබන සේවකයින් 13 දෙනා විශ්‍රාම යැවීමටත් ඒ සඳහා වැය වන රු.මිලියන 15.25 ක වියදමක් ලක්සල ආයතනය විසින් දැරීමටත් තීරණය වී තිබුණි. කෙසේ වුවද, එම මුදල ලක්සල ආයතනය විසින් 2012 දෙසැම්බර් 12 දින රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත ගෙවා තිබුණද, අදාළ දේපල ලක්සල ආයතනය වෙත පවරා දී නොතිබුණි. එසේ වුවද, එම දිනයේදීම සේවකයන් විශ්‍රාම ගැන්වීමට කටයුතු නොකර 2016 සැප්තැම්බර් 30 දක්වා පමා වීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය සඳහා රු.13,406,580 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීත්‍යානුකූලව පැවරීමට ඉතා ඉක්මනින් කටයුතු කරන බව. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේපල පවරා දීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2013 ඔක්තෝබර් 25 දිනැති අංක අමප/13/1459/553/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සමාගමට අයත් රත්මලාන තෙලවල පාරේ පිහිටි ඉඩම රජයේ තක්සේරුවක් මත විශේෂ කාර්යය බලකා කඳවුරක් පිහිටුවීම සඳහා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයට පැවරීමට අනුමත කර තිබුණි. තවද, ගොඩනැඟිලි සහිත ඉඩම් 05 ක් විවිධ අමාත්‍යාංශ හා ආයතනවලට පැවරීම් කර පරිහරණය කරනු ලැබුවද නීත්‍යානුකූලව පවරා දී නොතිබුණි. | මෙය කිරීමට සටහන් කර ගත් බව. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඉ) | 2016 අගෝස්තු 30 දින ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ කටයුතු සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ලද රු.299,159,745 ක මුදලින් සීමාසහිත ලංකා සළුසල සමාගමෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා සහ සමාගම පවත්වාගෙන යෑමේ කටයුතු සඳහා රු.2,642,906 ක මුදලක් වැය කොට තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ කටයුතුවලින් ඉතිරිය වෙනත් කටයුතු සඳහා යොදවා ගැනීමට පෙර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතුය. |
| (ඊ) | 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 2/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය පරිදි, වාර්ෂිකව ගණනය කරන ලද පාරිතෝෂිත වෙන් කිරීම් සඳහා අදාළ මුදල් නිසි පරිදි ගිණුමක තැන්පත් කළ යුතු අතර සේවකයෙකු පාරිතෝෂිත මුදල් ලබා ගැනීමට සුදුසුකම් ලද පසුව හැකි ඉක්මනින් අදාළ මුදල් ඔහු වෙත ලබාදීම කළ යුතුය. එසේ වුවද, එපරිදි ක්‍රියා නොකිරීම හේතුවෙන් 2021/2022 වර්ෂයේදී අධිභාර වශයෙන් රු.224,739 ක් ගෙවා තිබුණි. | ආයතනයේ පැවති අයහපත් මූල්‍ය තත්ත්වය මත මෙම නෛතික ගෙවීම් ප්‍රමාද කොට ඇති අතර පසුව අධිකරණ වලින් ලැබුණු නියෝග මත මෙම ගෙවීම් සිදු කළ බව. | වාර්ෂිකව ගණනය කරන ලද පාරිතෝෂිත වෙන් කිරීම් සඳහා අදාළ මුදල් නිසි පරිදි ගිණුමක තැන්පත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2008 වර්ෂයේදී වසර 30 ක බදු කාලසීමාවකට යටත්ව ගාල්ල උණවටුන නිෂ්පාදන ආයතනය, බාහිර පාර්ශවයකට බදු දී තිබූ අතර බදුදීමට අදාළව දෙපාර්ශවය එකඟ වූ බදු ගිවිසුම සමාගම විසින් කඩකිරීම නිසා එකී අය එයට විරුද්ධව නඩු පවරා තිබුණි. එම නඩුවට අනුව පැමිණිලිකාර පාර්ශවය විසින් තබා තිබූ රු.750,000 ක් වූ ආරක්ෂිත තැන්පතුව හා රු.1,141,400 ක් වූ ඉදිකිරීම් ද සමඟ එකතුව රු.1,891,400 ක් ගෙවිය යුතුව තිබුණි. එසේ වුවද රු.1,357,500 කට දෙපාර්ශවය එකඟ වී 2017 සැප්තැම්බර් සිට 2019 පෙබරවාරි දක්වා කොටස් වශයෙන් එකතුව රු.600,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද, ඉතිරි මුදල මාස 8ක කාලයක් යන තුරු ගෙවීමට කටයුතු නොකිරීම නිසා නැවතත් රු.1,891,400 ක මුදලම ගෙවීමට සිදු වී තිබුණි. එම හේතුවෙන් කලින් ගෙවන ලද කොටස් මුදල රු.600,000ක්, ප්‍රමාද ගාස්තු රු.65,000 ක් හා ඇස්කිසිය ක්‍රියාත්මක කිරීමේ ගාස්තුව ලෙස රු. 202,750 ක් වශයෙන් අයකිරීම නිසා රු.802,968 ක් වැඩිපුර ගෙවීමක් සිදුවී තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව. | ගිවිසුම්ගත වීමට පෙර සියලු දෑ සම්බන්ධයෙන් සලකා බැලිය යුතුය. |
| (ඈ) | ප්‍රධාන ගබඩාවේ රෙදිපිළි තොග සම්බන්ධයෙන් තොග ලැබීම් හා නිකුත් කිරීම් පදනම් කරගෙන තොග ලේඛනයක් 2017 සිට 2022 ඔක්තෝබර් වන විටද, නඩත්තු කර නොතිබුණු අතර ලැබීම් හා නිකුත් කිරීම් වෙන වෙනම ලේඛන දෙකක අක්‍රමවත්ව සටහන් කර තිබුණි. එම නිසා එම ලේඛන පදනම් කර ගනිමින් තොග ලේඛනය යාවත්කාලීන කළ නොහැකි බව නිරීක්ෂණය විය. එබැවින් ගබඩාවේ පවතින එක් එක් තොග අයිතමවල පොත් ශේෂයක් ලබාගත නොහැකිවීම නිසා භෞතික ශේෂයේ නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි වී තිබුණි. | මේ සඳහා දැනටමත් භාණ්ඩ ලැබීම් පත්‍රිකාවක් හඳුන්වා දී තොග ලේඛනද නිසි ලෙස පවත්වා ගෙන යන අතර තව දුරටත් මෙම දුර්වලතාවය මග හැර ගැනීම සඳහා පරිගණක මෘදුකාංගයක්ද හඳුන්වා දී ඇති බව. | ගබඩාවේ පවතින එක් එක් තොග අයිතමවල පොත් ශේෂයක් ලබාගත හැකි ලෙස තොග ලේඛනයක් නඩත්තු කළ යුතුය. |

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සළුසල සමාගමේ අලෙවිසැල් හා නිෂ්පාදන කර්මාන්ත ශාලා ස්ථාන 24 කින් ස්ථාන 07 ක පැවති ගොඩනැගිලි 9 ක් පිහිටි එකතුව රූඩ් 4 යි පර්චස් 103.74 ක් වූ ඉඩම් කිසිදු ඵලදායී කටයුත්තක් සඳහා යොදා නොගෙන ඌන උපයෝජිතව පැවතුණි. | ආයතනයේ කාරක ප්‍රාග්ධනය ගැටලුකාරි තත්ත්වයකට පත්වීම හේතුවෙන් බොහොමයක් වත්කම් ඌන උපයෝජිත තත්ත්වයට පත් විය. මෙම වත්කම් නිසි උපයෝජනයකට පත් කිරිම සඳහා පෞද්ගලික අංශයේද සහාය ඇතුව ව්‍යාපාර කටයුතු ආරම්භ කොට පවත්වා ගැනීමට සැලසුම් කරමින් පවතින බව. | ඉඩම් ගොඩනැගිලි ඵලදායී ලෙස යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලංකා බැංකු ජංගම ගිණුමක රු.මිලියන 5 ක සිට රු.මිලියන 13ක් අතර පරාසයක ශේෂයක් 2021 ඔක්තෝබර් සිට 2022 මාර්තු දක්වා අඛණ්ඩව මාස හයක කාලයක් පුරා පැවති අතර එම මුදල් ඵලදායීව කෙටිකාලීන ආයෝජනවල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ජංගම බැංකු ගිණුමේ පවතින අතිරික්ත ශේෂයන් කෙටි කාලීන ආයෝජනවල යෙදවීමට අදාළ වූ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය දැනටමත් ලබාගෙන ඇති බව. | මුදල් ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 04. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධිමත් මූල්‍ය පාලන ක්‍රම හඳුන්වා නොදීම, බදු සහ ණය වැනි අත්‍යවශ්‍ය ගෙවීම් සිදු නොකිරීම. මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් වාර්තා කිරීමේදී මුදල් පොත නඩත්තු නොකිරීම, පාලන ගිණුම් හා සැසඳීම් සිදු නොකිරීම නිසා ඒවායේ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පරීක්ෂා කිරීමට නොහැකි විය. | නඩත්තු කළ යුතු ලේඛන පවත්වා ගැනීමටත්, සමීක්ෂණ මණ්ඩල පත්කර සමීක්ෂණ කටයුතු සිදු කිරීමටත් හා අනෙකුත් පද්ධති හා පාලන ක්ෂේත්‍රවල වැඩි දියුණු කළ යුතු අංශ කුමක්ද යන්න හඳුනාගැනීමටත් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව . | පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම, සමීක්ෂණ මණ්ඩල පත්කර වත්කම් සමීක්ෂණය නොකිරීම හා නිෂ්පාදනාගාරය හා අලෙවිසැල් ඇතුළුව සියළුම ඉඩම් ප්‍රත්‍යාගණනය නොකිරීම. | | -එම- |
| (ඇ) | අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට පියවර නොගැනීම හා ඒ පිළිබඳ වාර්තා ක්‍රමාණුකූලව සහ විස්තරාත්මකව පවත්වා නොගැනීම. | | -එම- |